වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**1. තනතුර : අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ)**

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**සේවා ගණය :** ජ්‍යෝෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1)

**වැටුප් ක්‍රමය:** රු.140,640/-, 15x4,100/=රු.202,140/- (HM1-1 2025) ( මාසික )+රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර : රු.123,019/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන 11 අනුව 01.01.2026 දිනට)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව හෝ ජීව විද්‍යා ප්‍රථම උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සමඟ

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

පොල් සංවර්ධන අධිකාරියේ කළමනාකාර සේවා ගණයේ (MM 1-1) 1 වන ශ්‍රේණියේ වැටුප් පරිමාණය හිමි තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ප්‍රතිලාභ :**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය/ කම්කරු වන්දි රක්ෂණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ
5. ප්‍රවාහන පහසුකම් සමඟ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව හෝ මාසික ප්‍රවාහන දීමනාව රු.50,000/- ක් සමඟ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හා 1/2015(1) පරිදි)

**2. තනතුර : සහකාර අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන)**

**තනතුරු සංඛ්‍යාව : 01**

**සේවා ගණය :** මධ්‍යම කළමනාකාර සේවා ගණය (MM 1-1)

**වැටුප් ක්‍රමය:** රු.91,690/-, 10x2,480/-, 15x3,450/-, =රු.168,240/- (MM1-1 2025)
(මාසික )+රජයේ දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු.81,710/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන 11 අනුව 2026.01.01 දිනට)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ශුද්ධ/ව්‍යවහාරික, ජීව විද්‍යා, කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

සමඟ

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

6.

පොල් සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM 1-2) සේවා ගණයේ 11 ශ්‍රේණියෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

හෝ

පොල් සංවර්ධන අධිකාරියේ MA 3 වැටුප් පරිමාණය හිමි තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම සමඟ බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

7.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**3. තනතුර : සහකාර අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ)**

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**සේවා ගණය :** මධ්‍යම කළමනාකාර සේවා ගණය (MM 1-1)

**වැටුප් ක්‍රමය:** රු.91,690/-, 10x2,480/-, 15x3,450/-, =රු.168,240/- (MM1-1 2025)
(මාසික )+රජයේ දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු. 81,710/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන

12 අනුව 2026.01.01 දිනට)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අලෙවිකරණ/ආර්ථික විද්‍යා/ව්‍යාපාර පරිපාලන/වාණිජවේදී හෝ කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

සමඟ

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

පොල් සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM 1-2 ) සේවා ගණයේ 11 ශ්‍රේණියෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

හෝ

පොල් සංවර්ධන අධිකාරියේ MA 3 වැටුප් පරිමාණය හිමි තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම සමඟ බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

8.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**4. තනතුර : වැඩසටහන් සහකාර (අභ්‍යන්තර විගණන)**

**පුරප්පාඩු සංඛ්‍යාව** - 01

**සේවා ගණය** - ආශ්‍රිත නිලධාරී (MA 3)

**වැටුප් ක්‍රමය:** රු.53,940/-, 10 x800/-, 11x1,190/-, 10x1,320/-, 5x1350/-=රු.94,980/- (MA 3 2025) ( මාසික )+රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු.49,831/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන 11 අනුව 2026.01.01 දිනට )

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජවේදී/ගණකාධිකරණ/ව්‍යාපාර පරිපාලනය/රාජ්‍ය පරිපාලනය/කළමනාකරණ පිළිබඳ උපාධියක් ලබාතිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා

පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

9.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**5. තනතුර : පරීක්ෂක**

**පුරප්පාඩු සංඛ්‍යාව** - 06

**සේවා ගණය** - කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2 )

**වැටුප් ක්‍රමය:** රු.50,540/-, 10 x540/-, 7x630/-, 4x1,080/-, 20x1,280/-=රු.90,270/- (MA 2-2 2025)රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු.46,960/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන 11 අනුව 2026.01.01 දිනට )

**රාජකාරී ස්වභාවය :** පොල් කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ පූර්ණ කාලීන ක්ෂේත්‍ර රාජකාරිවල යෙදීමට සිදුවන අතර අවස්ථානුකූලව සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව රාජකාරිවල යෙදීමට ද සිදු වේ. වලංගු යතුරුපැදි පැදවීමේ බලපත්‍ර හිමි අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ. අදාළ රාජකාරී විස්තරය **www.cda.gov.lk** වෙබ් අඩවියේ සවිස්තරාත්මකව දක්වා ඇත.

**අධ්‍යාපන සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි යන විෂයයන් හතරට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින්(06) සමත්ව තිබීම.

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

**සමඟ**

**තාක්ෂණික නිපුණතා/ප්‍රවීණතා:**

අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ-05) පස්වන මට්ටමට සරිලන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, රජයේ කාර්මික පුහුණු ආයතනයක හෝ වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක් විසින් මෙහෙයවනු ලබන වසරකට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ තාක්ෂණික ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

අදාළ ක්ෂේත්‍රයේ වසරකට (01) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ.

**වයස:** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා , ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ :**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය/ කම්කරු වන්දි රක්ෂණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

**වෙනත් :**

ඉහත සියළුම තනතුරු සඳහා

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
4. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරණ ලද තනතුරු, සේවය කරන ලද කාල සීමාව, සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව තමා විසින්ම පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට **2025.12.26 දින හෝ ඊට පෙර එවිය යුතුය.** අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් ද පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් **සිය අයදුම්පත් අංශ ප්‍රධානීන්** මගින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මගින් යොමු කරනු නොලබන **අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහිද පල කර ඇත. **www.cda.gov.lk**

සභාපති
පොල් සංවර්ධන අධිකාරිය
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට,

කොළඹ 05.